PR/2019/15/S

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan


**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ශ්‍රීමත් ආර්. පී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

දුරකථනය (+94-11-2693831~3, ෆැක්ස් (+94-11-2698629)

ඊමේල්: cultujpn@co.mofa.go.jp


**පුවත්පත් නිවේදනය**

2019 මාර්තු මස 13 වන දින

**ජපානයෙන් අනුරාධපුරයේ තිරසාර කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ජල කළමනාකරණ පද්ධතියක්**

ජපන් රජය මගින් එහි බිම් මට්ටමේ මානව ආරක්ෂණය සඳහා වන ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ , "අනුරාධපුරයේ තිරසාර කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ජල කළමනාකරණ පද්ධතියක්" යන ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් 89,285 (දළ වශයෙන් රුපියල් මිලියන 16 ක) ප්‍රදානයක් ලබාදීමට තීරණය කර ඇති අතර ඒ සඳහා වන ගිවිසුමට අත්සන් තැබීම 2019 මාර්තු 13 වන දින, ජපන් තානාපති අකිරා සුගියාමා මහතා සහ සේවාලංකා පදනමේ සභාපති ආචාර්ය හර්ෂ කුමාර නවරත්න මහතා අතර ජපන් තානාපති නිල නිවසේ දී අත්සන් තැබිය.

මෙම ව්‍යාපෘතිය තුලින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගොවින්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන සහ ජීවනෝපාය සංවර්ධනය කිරිමේ අරමුණින් ඔවුන්ට අවශ්‍ය ළිං, එළවළු සැකසුම් මධ්‍යස්ථානයක්, එයට අවශ්‍ය උපකරණ ආදිය ලබා දීම සහ වාරිමාර්ග පහසුකම් සැපයීම සිදු වේ. මීට අමතරව, කාබනික ගොවිතැන හා අලෙවිකරණය සඳහා පුහුණුවක්ද ගොවීන් සඳහා ලබා දීමට නියමියතය.

'නොච්චියාගම' වියළි කළාපයේ පිහිටා ඇති අතර බහුල වශයෙන් නියඟයෙන් පීඩාවට පත් ප්‍රදේශයකි. ගොවින් බොහොමයකට වාරිමාර්ග පද්ධතියක් නොමැති බැවින්, ඔවුන් වසරකට මාස කිහිපයකට සැරයක්, වැසි සමයේ පමණක් වගා කටයුතු වල නිරත වේ. ඉදිරි වසර තුල ඔවුන්ට තමන්ගේ ඉඩම්වල වගා කළ නොහැකි අතර අනෙකුත් වගා බිම්වල දෛනික

වැටුප් ලබන සේවකයන් ලෙස වැඩ කරති. මෙම ව්‍යාපෘතිය තුලින් ලබාදෙන පහසුකම් සහ පුහුණුව මගින් ගොවින්ට කාබනික එළවළු වගා කළ හැකි අතර, ඒවා සෞඛ්‍යාරක්ෂාවෙන් යුතුව සකස් කර ඉහල ප්‍රමිතියකින් අලෙවි කෙරේ. සේවා ලංකා පදනම මෙම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ගොවීන්ට සහයෝගය ලබා දෙයි.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදහස් දැක්වූ සේවාලංකා පදනමේ සභාපති ආචාර්ය හර්ෂ නවරත්න මහතා ප්‍රකාශ කළේ, මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති ප්‍රදේශය අනුරාධපුරයේ වියළි කලාපයේ පිහිටා ඇති අතර, වසරකට සීමිත ප්‍රමාණයක වර්ෂාපතනයක් වාර්තා වන බවයි. එම නිසා තිරසාර වාරිමාර්ග පද්ධතියක් ගොඩ නැංවීම ඔවුන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහල නැංවීම සඳහා වැදගත් වේ. මෙම ව්‍යාපෘතිය මෙන්ම වෙනත් බිම් මට්ටමේ ව්‍යාපෘති ලබා දුන් ජපන් ජනතාව හා ජපන් තානාපති අති ගරු අකිරා සුගියාම මහතාට ද අපගේ ස්තුතිය පුද කර සිටිමු.


වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න

ජපන් තානාපති කාර්යාලයේ ආර්ථික සහයෝගිතා අංශය

දුරකථන අංක 011-2693831 දිගුව 225

ඊමේල් : cultujpn@co.mofa.go.jp